සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவலகள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/08/01/AP/2023
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2023.01.20

***සමෘද්ධි චක්‍රලේඛ අංක : 2023/01***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධිත අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමාජ සංවර්ධන විෂයභාර දිස්ත්‍රික් කළමනාකරුවන් ,
සියළුම බැංකු සමිති කළමනාකරුවන්,
සියළුම සමාජ සංවර්ධන සහකාර නිලධාරින් වෙත.

**<u>සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2023</u>**

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. ඒ අනුව සමෘද්ධි ව්‍යාපාරය දිළිඳු සහන වැඩපිළිවලකට පමණක් සීමා නොවී ආර්ථික පුනර්ජීවනය ඇති කොට, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර නූතන ප්‍රවනතා සමග බද්ධ වූ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම හා සමාජ සුභසාධන හා සහනාධාර වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම වඩා තාර්කික හා විද්‍යාත්මක ක්‍රමවේදයක් මගින් සිදු කිරීම යන අරමුණු පෙරදැරිව අවාසිසහගත තත්වයට පත් ජනතාව ආර්ථික, සාමාජීය, භෞතික, මානසික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා ඵලදායි වැඩසටහන් ප්‍රජා සහභාගිත්වය ලබා ගනිමින් 2023 වසරට ක්‍රියාත්මක කිරීමට සමාජ සංවර්ධන හා පරිසර අංශය පහත අයුරින් වැඩසටහන් පෙළගස්වා ඇත.

02. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජන ජීවිතය සංවර්ධනය කිරීම සඳහා බොහෝ ආර්ථික වැඩසටහන් ක්‍රියාවට නංවා ඇතත්, දිනෙන් දින වර්ධනය වන සමාජීය ගැටලු නිසා අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟාවීමට නොහැකි වී ඇත. ප්‍රජාවගේ සමාජීය ගැටලු වලට ආමන්ත්‍රණය කිරීම සඳහා බොහෝ ආයතනගත නිළධාරින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් රාජකාරිවල නිරතව ඇතත්, ඔවුන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු නොකිරීම නිසා පොදුවේ ග්‍රාමීය ප්‍රජාව මුහුණ දෙන ගැටළුවලට තිරසාර විසඳුම් ලබා ගැනීමට නොහැකි වී ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

එම අභියෝග ජය ගැනීම සඳහා 2023 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් ඇතුළු සියලු සමාජ සංවර්ධන සහකාර නිලධාරීන්, වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා ප්‍රජා නායකයින්ගේ ක්‍රියාකාරී දායකත්වය ඇතිව දිස්ත්‍රික්කයට එකක් බැගින් වූ ගම්මාන 25ක් 2023 වර්ෂයේ දී සංවර්ධනය කිරීමට අදහස් කර ඇති අතර එම ගම්මාන තුළින් හඳුනා ගන්නා ආර්ථික සමාජීය ගැටළුවලට විසඳුම් ලැබෙන ආකාරයට සමස්ථ සමාජ සංවර්ධන වැඩසටහනම පෙළගස්වා ඇත.

**01. මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හ සතුටු පවුල් වැඩසටහන.**

වර්තමානය වනවිට, දුම්වැටි මත්වතුර හා නොයෙකුත් අහිතකර ද්‍රව්‍යවලට ප්‍රජාව, තරුණ තරුණියන් හා දරුවන් ඇබ්බැහිවීම විශාල වශයෙන් වැඩි වී ඇත. එබැවින් මෙම ඇබ්බැහිවීම් වැළැක්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. විශේෂයෙන් තෝරාගන්නා ලද ආදර්ශ ගම්මාන තුලද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ.

ගෘහ කළමනාකරණ හා සතුටු පවුලක් මේ තුලින් ඇති කිරීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම්ද දුම්වැටි හා මත්ද්‍රව්‍ය වලින් ප්‍රජාව මුදා ගැනීම සඳහා වූ වැඩසටහන් අන්තරයාකර ඖෂධ පාලක මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතනවල න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ඇති සම්පත් දායකයින් යොදාගෙන ක්‍රියාත්මක කිරීමට මෙවර සැලසුම් කර ඇති අතර ඒ සඳහා වූ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ගත යුතුවේ.

**02. සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන**

දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මෙන්ම අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් දරුවන් නිර්මාණය කිරීම සඳහා අවු 05 – 18 අතර වයසේ පසුවන දරුවන් ග්‍රාමීය මට්ටමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශී කරමින් ඔවුන් සමග විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙමින් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් ගුණ නුවණින් යුතු අභියෝග ජය ගත හැකි දරුවන් දැයට දයාද කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

2020 / 2021 හා 2022 වර්ෂවල පැවැති Covid වසංගත තත්වය සහ රටේ පැවැති ආර්ථික අර්බුධ හමුවේ ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර 2023 වසරේ සිට උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් DSD/HO/07/SD/S.K.C.S හා 2022.12.13 දින ලිපිය මගින් ලබා දී ඇත. ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් වෙනම චක්‍රලේඛයක් 2023 පෙබරවාරි මාසයේ නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

**03. ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

2023 වසරට අදාලව පහත පරිදි ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරගත යුතුවේ.

1. ජාත්‍යන්තර කාන්තා දින (මාර්තු 8)
2. ජාත්‍යන්තර දුම්වැටි හා මත්විරෝධි දිනය (මැයි 31)
3. ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (සැප් 08)
4. ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය (ඔක්. 01)
5. ජාත්‍යන්තර දිළිඳුකම පිටු දැකීමේ දිනය (ඔක්. 17)

මෙම සියළු වැඩසටහන් සමාජ සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වන අතර ඒ ඒ දිනයන්ට අදාලව වෙන වෙනම උපදෙස් පත්‍රිකා හා චක්‍රලේඛ නිකුත් කිරීමට නියමිතව ඇත.

**04. සනීපාරක්ෂක පහසුකම් සැපයීම් වැඩසටහන**

මේ යටතේ වඩාත් සුදුසු ප්‍රමුඛතාවය දැක්විය යුතු ඉල්ලීම් සීමිත ප්‍රමාණයක් පසුගිය වසරේ ලැබී ඇති අතර එම ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය ලබාදෙමින් සිදු කිරීමට නියමිතව ඇත. එමෙන්ම මෙම වසරේ ක්‍රියාත්මක ආදර්ශ ගම්මාන 5 සඳහාද ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කළ යුතුව ඇත.

**05. නිපුණතා සංවර්ධණ පුහුණු වැඩසටහන**

සමාජ සංවර්ධන විෂයට අදාලව කටයුතු කරන සියලු නිලධාරී කාර්යමණ්ඩලවල කුසලතා වර්ධනය කිරීම උදෙසා වන පුහුණු වැඩසටහන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

**06. ආදර්ශ ගම්මාන 25 නිර්මාණය කිරීම**

මෙම ගම්මාන වැඩසටහන සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම ආදර්ශ ගමක් තෝරාගත යුතුවේ. එම ගම්මානය සඳහා සමෘද්ධි ව්‍යාපාරය හරහා ලබාදෙන සියලු ප්‍රතිලාභ ලබා දීම තුලින් ආර්ථික වශයෙන් මෙන්ම සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා සාමාජීය වශයෙන්ද සවිබල ගැන්වූ පවුල්වලින් හෙබි “සොඳුරු” ගමක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වේ. මෙහිදි උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති නිලධාරීන්ගේ මැදිහත් වීම් තුලින් එම ගම්මානයේ ප්‍රජාවගේ මානසික සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. ඔබ දිස්ත්‍රික්කයේ තෝරාගන්න ලද ගම පිළිබඳව ඇමුණුම III ට අනුව තොරතුරු සමග ව්‍යාපෘති වාර්තාවක්, සංවර්ධන සැලැස්මක් පෙබරවාරි 20 ට ප්‍රථම ලබා දීමට කටයුතු කළ යුතුවේ.

## 07. ලෝක ආහාර වැඩසටහන

2022 වසරේ ලෝක ආහාර වැඩසටහන යටතේ මොණරාගල, නුවරඑළිය, ගාල්ල, අම්පාර, යාපනය, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්කවල තෝරාගත් බැංකු කලාපවල පවුලේ සමාජිකයින් 4 ක් හෝ 4 ට වැඩි පවුල් සඳහා ආහාර සුරක්ෂිතතාවය උදෙසා රු. 15000/- ක් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක විය.

2023 වසරටද ලෝක ආහාර වැඩසටහන එම ආයතනය විසින් තෝරගනු ලබන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට නියමිත හෙයින් ඒ සඳහා සමාජ සංවර්ධන විෂය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ පූර්ණ මැදිහත් වීම සිදුකළ යුතුව ඇත. එහි ප්‍රගතිය ද එම නිලධාරින් හරහා ලබා ගැනීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහනට අදාලව අවශ්‍ය කරන උපදෙස් හා මගපෙන්වීම් ලිපි ඉදිරියේ දී ලබා දීමට නියමිත අතර එහි ප්‍රගතියට අදාල ඇමුණුමද පසුව ලබාදෙනු ඇත.

## 08. පළමු වසරේ සිට 05 වසර දක්වා පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන

වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ අඩු ආදායම්ලාභි පවුල්වලට තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සිදුකර ගැනීම මහත් අභියෝගයක්ව පවතී. එබැවින් 01 වසරේ සිට 05 වසර දක්වා දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් හා උපකරණ ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ක්ෂුද්‍රමූල්‍ය අංශය, ප්‍රජාමූල සංවිධාන අංශය හා එක්ව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කරන මගපෙන්වීම් ඉදිරියේ දී ලබාදීමට නියමිත වේ.

පළමු අධියර යටතේ ග්‍රාමීය පාසල්වල අඩුආදායම්ලාභි 05 වසර දරුවන්ට මෙම වසරේ ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරනු ඇති අතර අදාල මගපෙන්වීම්වලට අනුව කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දිය යුතුවේ.

## 09. පිවිතුරු වෙරළක් වැඩසටහන

සමුද්‍ර දූෂනය අවම කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය මගින් තිරසාර ලෙස වෙරළ භාවිතා කිරීම සඳහා වෙරළ රැක බලාගනනන් (Beach care – takers) ස්ථාපිත කිරීමේ අරමුණින් සමුද්‍රීය පරිසර දෙපාර්ත මේන්තුව එක්ව අවබෝධතා ගිවිසුමකට අනුව පසුගිය වසරේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ අතර 2023 වසර සඳහා නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් අනතුරුව වැඩසටහන ක්‍රියාවට නැංවීමට නියමිතව ඇත.

එහි ප්‍රගතිය පසුගිය වසරේදී ලබාදී ඇති ආකෘතිය පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට මාසිකව එවිය යුතුය. නව උපදෙස් සහිත උපදෙස් ලිපියක් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ලබාදීමට නියමිත වේ. මෙම කාර්යය වෙරළ ආශ්‍රිත දිස්ත්‍රික්ක 14ක් තුල, වෙරල ආශ්‍රිත ප්‍රතිලාභීන් සම්බන්ධ කරගෙන ඔවුන්ට යම් දීමනාවක් සමෘද්ධි බැංකුව හරහා ලබාදෙමින් ක්‍රියාත්මක වේ.

**10.ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම.**

***i. දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය***

සමස්ථ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සොයා බැලීම සඳහා විෂයට අදාල නිලධාරීන් දිස්ත්‍රික්කයට කැඳවා කාර්තුවකට එක් ප්‍රගති සමාලෝචනයක් බැගින් සිදු කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් නිලධාරීන් කැඳවීම සුදුසු වේ.

i. දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයභාර කළමනාකරු/ සංවර්ධන නිලධාරි
ii. සමෘද්ධි ලොතැරැයි වැඩසටහන භාරව කටයුතු කරන කළමනාකරු
iii. බැංකු සමිති කළමනාකරු
iv. දිස්ත්‍රික්කයේ සියලුම සමාජ සංවර්ධන සහකාරවරුන්

**ii. ජාතික ප්‍රගති සමාලෝචනය**

මාස 06 කට වරක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට කැඳවා සමස්ථ වැඩසටහනේ ප්‍රගතිය හා ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම. (Presentation මගින්)

ඒ සඳහා පහත සඳහන් නිලධාරින් කැඳවීමට නියමිත වේ.

i. දිස්ත්‍රික් විෂයභාර කළමනාකරු
ii. සමාජ සංවර්ධන සහකාරවරුන්

ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. මහාභාණ්ඩාගාර යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය සෑම මසකම 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගෙන සකස්කර ගත් දිස්ත්‍රික් වාර්තාව සෑම මසකම 10 දිනට පෙර සමාජ සංවර්ධන අංශයට ලබාදිය යුතුය. (ඇමුණුම I)

ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධාන අරමුදලින් මුදල් ප්‍රතිපාදන ලබාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා එම ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇති සමාජ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතියද ඉහත දිනටම ලබාදීමට කටයුතු කළ යුතුවේ. ( ඇමුණුම II)

සමාජ සංවර්ධන වැඩසටහනට අදාල ප්‍රගතිය කඩිනමින් ලබාදීමට socialdev@samurdhi.gov.lk ඊ-මේල් ලිපිනය හෝ 0112889005 දරන Fax අංකය භාවිතා කළ හැකි අතර එය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් සනාථ කළ යුතු වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා අංක 0112889046 හා 0112876601 මගින් සමාජ සංවර්ධන අංශය ඇමතීමෙන් ලබාගත හැකිය.

ආර්.පී.බී. තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස
2. විගණන අධිකාරී, රජයේ විගණන අංශය - කා. දැ.ගැ.ස
3. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස
5. සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ගැ.ස

**ඇමුණුම 01**

# භාණ්ඩාගාර ප්‍රතිපාදන
## සමාජ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ................. දිනට

**දිස්ත්‍රික්කයේ නම :-**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 1 | | | 2 | | | 3 | | | 4 | | | 5 | | | 6 | | | 7 | | | 8 | | | මුළු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. |
| 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මුළු එකතුව | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

1 මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන.
2 සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන
3 ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4 සනීපාරක්ෂක පහසුකම් සැපයීම් වැඩසටහන
5 නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන
6 ආදර්ශ ගම්මාන 25 නිර්මාණය කිරීම
7 පළමු වසරේ සිට 05 වසර දක්වා පාසැල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන
8 ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම

සැ.යු. * ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්වල ප්‍රගතිය වෙනම දක්වන්න

| | | |
|---|---|---|
| ............................... | .............................. | ................................. |
| සකස් කළේ | නිර්දේශ කළේ | අනුමත කළේ |

ඇමුණුම **02**

## භාණ්ඩාගාර නොවන ප්‍රතිපාදන හා වෙනත් අරමුදල
## සමාජ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය .................. දිනට

**දිස්ත්‍රික්කයේ නම :-**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 1 | | | 2 | | | 3 | | | 4 | | | 5 | | | 6 | | | 7 | | | 8 | | | මුළු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව | වැය වූ මුදල රු. ශ. |
| 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මුළු එකතුව | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

1 මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හ සතුටු පවුල් වැඩසටහන.
2 සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන
3 ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4 සනීපාරක්ෂක පහසුකම් සැපයීම් වැඩසටහන
5 නිපුණතා සංවර්ධණ පුහුණු වැඩසටහන
6 ආදර්ශ ගම්මාන 25 නිර්මාණය කිරීම
7 පළමු වසරේ සිට 05 වසර දක්වා පාසැල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන
8 ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම

සැ.යු. * ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්වල ප්‍රගතිය වෙනම දක්වන්න

............................... සකස් කළේ

.............................. නිර්දේශ කළේ

.................................. අනුමත කළේ

ඇමුණුම III

**" සියවසට පියවරක්" දැක්ම පෙරදැරිව ආදර්ශ ගම්මාන වැඩසටහන**

**........................................... දිස්ත්‍රික්කය**

ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වූ "සොදුරු ගමක්" ගොඩනැගීම

1. තෝරාගත් ගම අයත් දිස්ත්‍රික්කය :- ..........................................................................................

2. තෝරාගත් ගම අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :- ..................................................

3. තෝරාගත් ගමට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව :- ............................................................

4. නගරයේ සිට ගමට ඇති දුර ප්‍රමාණය :- ........................................................................................

5. සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව :- ..........................................................................................................

6. ආබාධිත පුද්ගලයින් සිටින පවුල් සංඛ්‍යාව :- ..................................................................................

7. නිවාස නොමැති පවුල් සංඛ්‍යාව :- ...................................................................................................

8. පාසල් යන දරුවන් පිළිබඳ විස්තර :- (සංඛ්‍යාව සටහන් කරන්න) ...............................................

   i. පළමු වසරේ සිට - 5 වසර දක්වා :- ☐ iv. අ.පො.ස. උ.පෙළ :- ☐

   ii. 6 වසරේ සිට - 10 වසර දක්වා :- ☐ v. උපාධි සමත් :- ☐

   iii. අ.පො.ස. සා.පෙළ :- ☐ vii. උසස්පෙළ සමත් :- ☐

9. සවිබල ගැන්විය හැකි පවුල් සංඛ්‍යාව :- ..........................................................................................

10. පාසල් හැරගොස් ඇති සංඛ්‍යාව :- ......................................................................................................

    i. ස්ත්‍රී :- ☐ ii. පුරුෂ:- ☐

11. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින පවුල් සංඛ්‍යාව :- .........................................................................

12. සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් සංඛ්‍යාව :- ...........................................................................

13. ආදර්ශ ගම්මානය තුළ විවිධ හැකියා ඇති පුද්ගලයින් කණ්ඩායම් ගතකර දැක්වීම

    උදා:- වඩු ☐ පෙදරේරු ☐ ආදි වශයෙන්.